# (දරුවන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලිය හැඩගැසීම කෙරෙහි දෙමාපියන්ගේ ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණවල දායකත්වය)

වරුණි වික්‍රමආරච්චි[1]

කිසියම් රටක දේශසීමා පසුකරමින් සාමාන්‍ය පදිංචිය වෙනස් කරමින් සිදුවන අවකාශීය චලනය ජාත්‍යන්තර සංක්‍රමණය වශයෙන් හැඳින්වේ. පුද්ගලයා කිසියම් රැකියාවක් අපේක්ෂාවෙන් තමන් ජීවත්වන ප්‍රදේශයේ සිට වෙනත් ප්‍රදේශයක් දක්වා නැතහොත් සිය රටේ සිට වෙනත් රටක් දක්වා සංක්‍රමණය වීම ශ්‍රම සංක්‍රමණය (Labour migration) වශයෙන් සංක්‍රමණ පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (International organization for migration) නිර්වචනය කරයි.(IOM : 2008)

ශ්‍රී ලංකාවට 1977 විවෘත ආර්ථිකය හඳුන්වා දීමෙන් අනතුරුව ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණ වඩාත් පුළුල් ලෙස ප්‍රසාරණය විය. මෙම සංක්‍රමණ ප්‍රවාහය වැඩි වශයෙන්ම සිදුවූයේ බටහිර ආසියාව කරාය. නමුත්, එම සංක්‍රමණ ප්‍රවාහයට අමතරව 1977 ට පෙර යුගයේ සිටම ශ්‍රී ලාංකිකයන් ඉතාලිය බලා සංක්‍රමණය වීම සිදුවිය. ඒ අනුව වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයන් පුත්තලම දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව ප්‍රදේශයෙන් බහුල වශයෙන්ම ඉතාලි ශ්‍රම සංක්‍රමණ සිදුවී තිබේ. මෙවැනි පසුබිමක් තුළ පුත්තලම දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉතාලි ශ්‍රම සංක්‍රමණික පවුල්වල දරුවන් 100 දෙනෙකු නියැදිය වශයෙන් තෝරා ගැනීම සිදුවිය. මෙම පර්යේෂණයේදී දත්ත රැස් කිරීමේ ශිල්පක්‍රම වශයෙන් නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය සහ සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමය යොදා
ගන්නා ලදී. එහිදී මේ සඳහා වඩාත්ම සුදුසු පර්යේෂණ ක්‍රමවේදය වන්නේ කෘත්‍යාත්මක ක්‍රමයයි. ඉතාලි ශ්‍රම සංක්‍රමණිකයන් ශක්තිමත් ආර්ථික පසුබිමක් සාධනය කර ගන්නා අතර පවුල් සංස්ථාව තුළ විටෙක පියා පමණක් හෝ තවත් විටෙක මව පියා දෙදෙනාම ශ්‍රම සංක්‍රමණිකයන් වශයෙන් ඉතාලියට සංක්‍රමණය වේ. ඉතාලි ශ්‍රම සංක්‍රමණිකයන්ගේ දරුවන් ඉතා සුඛෝපභෝගී ජීවිතයකට හිමිකම් කියන අතර අනෙකුත් දරුවන්ට සාපේක්ෂව ඔවුන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලියේ විවිධ වෙනස්කම් රැසක් හඳුනාගත හැකිවේ. විදේශගත වූ දෙමාපියන්ගේ දරුවන්ගේ ආකල්ප සහ චර්යා රටාවන් හැඩගැසී තිබෙන ආකාරය පිළිබඳව අධ්‍යයනය කරන විට දෙමාපියන්ගෙන් බැහැරව ජීවත් වන මොවුන් විවිධ අපගාමී චර්යාවන්ට නැඹුරු වී සිටින බැව් පෙනේ.

මුඛ්‍ය පද : ජාත්‍යන්තර සංක්‍රමණ, ශ්‍රම සංක්‍රමණ, සමාජානුයෝජනය, විවෘත ආර්ථිකය, සංක්‍රමණිකයන්

1 සමාජ විද්‍යා අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.ල wwickramaarachchi@yahoo.com